**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

**වෙත යොමු කරන ලද**

**අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) පනත් කෙටුම්පත**

**සම්බන්ධයෙන්**

**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

**පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ**

**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසිනි**

**2025 මැයි මස 22 වැනි බ්‍රහස්පතින්දා**

---

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு**

**ஆற்றுப்படுத்தப்பட்ட**

**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தச்) சட்டமூலம்**

**மீதான**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**அறிக்கை**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**

**கௌரவ (டாக்டர்) நஜீத் இந்திக்க, பா.உ. அவர்களால்**

**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**

**2025 மே 22, வியாழக்கிழமை.**

---

**Report of the**
**Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**
**on**
**Code of Criminal Procedure (Amendment) bill**
**referred to Sectoral Oversight Committee on**

**Governance, Justice and Civil Protection**

**Presented to Parliament by**

**Hon. (Dr.) Najith Indika,M.P.**

**Chair of the Sectoral Oversight Committee on**
**Governance, Justice and Civil Protection**

**Thursday, 22 May 2025**

## කාරක සභාවේ වාර්තාව

2025 මැයි මස 20 වන දින පාර්ලිමේන්තුවේදී රැස් වූ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) පනත් කෙටුම්පත
  (2025 අප්‍රේල් මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,පා.ම. (සභාපති)
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.
ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
ගරු මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම.

**සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්:(කාරක සභාවේ ගරු සභාපතිතුමාගේ අනුමැතිය මත)**
ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා, පා.ම.
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය, පා.ම.
ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා, පා.ම.

**කාරක සභාවේ ලේකම්**
චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)

**සහභාගී වූ නිලධාරීන්**
**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**
පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නීති)
ජලාශි ලොකුනාරංගොඩ මහත්මිය, සහකාර ලේකම්(නීති)
බී.එම්.යූ.ජී.ඒ.කේ. බස්නායක මහතා, බන්ධනාගාර කොමසාරිස්(පාලන)
**නීතිපති දෙපාර්තමේන්තුව**
නීතිඥ සුදර්ශන ද සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්
ආචාර්ය අවන්ති පෙරේරා මහත්මිය, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්
**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**
ඩී.එම්.කේ.ඩී.කේ.දිසානායක මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**හැඳින්වීම**

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතට නිර්දේශිත සංශෝධන, ශ්‍රී ලංකාව තුළ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියට බලපාන සමකාලීන ගැටළුවලට කාලෝචිත විසඳුමක් ලෙස සැලකිය හැකි අතර විශේෂයෙන් ම සිරකරුවන් අධිකරණය වෙත ප්‍රවාහනය කිරීමේදී ද, අධිකරණ තුළ දී අවාසනාවන්ත ලෙස පුද්ගලයින් මිය යාම ඇතුළු ප්‍රචණ්ඩකාරී ක්‍රියා වැළැක්වීමද, අපරාධ අධිකරණවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටද, සියළුම පාර්ශවයන්ගේ යහපත උදෙසා සමකාලීන විද්‍යුත් තාක්ෂණය භාවිතා කිරීම මෙම සංශෝධනය මඟින් යෝජනා කෙරේ.

යෝජිත සංශෝධන මඟින් සැකකරුවකු හෝ චූදිතයකු අධිකරණය ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටීම බැහැර කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයාට හෝ මහාධිකරණ විනිසුරුවරයාට බලය පැවරීම, අධිකරණයේ විමර්ශනය හෝ නඩු විභාගය අතරතුර දී සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සබැඳියාවක් මඟින් සාක්ෂිකරුවන්ගෙන් දුරස්ථ සාක්ෂි සටහන් කර ගැනීමට මහේස්ත්‍රාත්වරයාට හෝ මහාධිකරණ විනිසුරුවරයාට බලය පැවරීම, රාජ්‍ය අංශයේ විශේෂඥයන් සඳහා එනම් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අධිකරණ වෛද්‍ය අංශයේ විශේෂඥයන් සඳහා විද්‍යුත් තැපැල හරහා සිතාසි යොමු කරන ලෙස සුදුසු අවස්ථාවේදී අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත නියෝග කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයාට හෝ මහාධිකරණයේ විනිසුරුවරයාට බලය පැවරීම සහ නඩුවට සම්බන්ධ පාර්ශවයන් විසින් එකී විශේෂඥයා පුද්ගලිකව පෙනී සිටිය යුතු බව අවධාරණය නොකරන්නේ නම් සහ සභාපති විනිසුරුවරයා විසින් එය සුදුසු යැයි සලකන්නේ නම්, එකී විශේෂඥයින් සාක්ෂි කැඳවීමකින් තොරව, විද්‍යුත් තැපැල හරහා අධිකරණය වෙත ලැබුණු විශේෂඥ වාර්තා ආවේශ්‍යා සාක්ෂි වශයෙන් පිළිගත

හැකි බවට උපකල්පනය කිරීම සඳහා විධිවිධාන ඇතුළත් කිරීම වැනි සාධනීය පියවර මෙම සංශෝධනය මඟින් නීතියට හඳුන්වා දීමට යෝජනා කර ඇත.

**<u>කාරක සභා නිරීක්ෂණ</u>**

1. සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සබැඳියක් හරහා, සිතාසි ලබාදුන් බව තහවුරු කර ගැනීම සඳහා යෝජිත සංශෝධන මඟින් ගෙන ඇති පියවර යටතේ ආවරණය ලැබෙනුයේ සාක්ෂිකරුවන්ට පමණක් බව
2. එසේම, මෙම පනතෙහි පවතින ප්‍රතිපාදන මඟින් විදේශගතව සිටින විශේෂඥ සාක්ෂිකරුවන්ට යවන ඊ මේල් පණිවිඩයක සිතාසි භාරගත් බවට තහවුරු කිරීමක් කළ යුතු බවත්, විනිශ්චයකරු විසින් සාක්ෂි විභාගය ආරම්භ කරනු ලබන්නේ සෑම පාර්ශවයකටම සිතාසි ලැබුණු බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව බව
3. මෙමඟින් විදේශගතව සිටින සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි ලබා ගැනීම පහසු කරවන බවත්, යම් කරුණක යුක්තිය ඉටු කිරීම සඳහා සහයෝගය ලබාදීමට කැමැත්තක් දක්වන පාර්ශවයන්ගෙන් සාක්ෂි ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බව

මීට අමතරව කාරක සභාවට සහභාගී වූ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නිලධාරීන් ඔවුන් විසින් සම්පාදිත කාරක සභා අවස්ථාවේ යෝජනා කාරක සභාවට ඉදිරිපත් කළ අතර, එකී යෝජනා සම්බන්ධයෙන් ද කාරක සභාව සිය අවධානය යොමු කර ඒවා සාධනීය මට්ටමේ පවතින බවට එකඟ විය.

**<u>කාරක සභාවේ තීරණ</u>**

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව අපරාධ නඩු විධාන සංග්‍රහය(සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා විසින් 2025 මැයි මස 22 වැනි බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.